# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2170/4 - 2020 අප්‍රේල් මස 08 වැනි බදාදා - 2020.04.08**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2017 අංක 12 දරන විදේශ විනිමය පනත

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වන වගන්තිය සමග කියවිය යුතු, 29 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග

1. ශ්‍රී ලංකාවේ සිටින නේවාසික ඕනෑම ශ්‍රී ලාංකික පුද්ගලයෙකු, ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික ඕනෑම ශ්‍රී ලාංකික පුද්ගලයෙකු, ද්විත්ව පුරවැසිභාවය ලබාගත් පුරවැසියන්, ශ්‍රී ලාංකීය සම්භවයක් ඇති වෙනත් රටවල පුරවැසියන්, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත/ලියාපදිංචි කළ අරමුදල්, සංස්ථාපිත මණ්ඩල, සංගම් සහ ශ්‍රී ලංකාවේ සුභසිද්ධිය පතන වෙනත් පාර්ශ්ව මෙම නියෝගයෙහි දිනයේ සිට මාස හයක කාලයක් තුළ තමන් වෙනුවෙන් බැංකු පද්ධතිය හරහා විදේශයන්ගෙන් ලද ආමුඛ ප්‍රේෂණවලින්, ශ්‍රී ලංකාවේ බලයලත් වෙළෙන්දෙකු සමග, නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් "විශේෂ තැන්පතු ගිණුම" නම් ගිණුමක් කාලීන තැන්පතු වශයෙන් විවෘත කිරීමට සහ පවත්වාගෙන යාමට මෙමගින් අවසර දෙනු ලැබේ.

2. විශේෂ තැන්පතු ගිණුමෙහි වැදගත් ලක්ෂණ පහත පරිදි වේ :

   I. අවම කාල සීමාව : මාස හයයි (06) ;

   II. *ගෙවිය යුතු පොළිය :* අදාළ බැංකුවෙහි සමාන කල්පිරීම් සහිත සාමාන්‍ය තැන්පතු සඳහා අදාළවන තැන්පතු පොළී අනුපාතවලට වඩා වාර්ෂිකව ප්‍රතිශතාංක එකක් සහ ප්‍රතිශතාංක දෙකක් පිළිවෙලින් මාස 6 ක සහ මාස 12 ක කාල සීමාවක් සහිත විශේෂ තැන්පතු ගිණුම් සඳහා කල්පිරීමේදී ගෙවනු ලැබේ.

   III. *අරමුදල් ආපසු යැවීම :* කාලීන තැන්පතුව කල්පිරීමේදී විදේශ මුදල් බවට පරිවර්තනය කිරීම සහ ආපසු යැවීම නිදහසේ සිදුකළ හැකිය.

3. විශේෂ තැන්පතු ගිණුම්, 2017 නොවැම්බර් 17 දිනැති අංක 2045/56 දරන අති විශෙෂ ගැසට් නිවේදනයෙහි පළකරන ලද 2017 අංක 1 දරන විදේශ විනිමය (බලයලත් වෙළෙඳුන් විසින් සිදු කරනු ලබන විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝගවල නිශ්චිතව දක්වා ඇති ඕනෑම කාර්ය පටිපාටිමය අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කරනු ඇත.


1A - G 032216 — 542 (2020/04)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සඳහා අදාළ නිර්ණායක, ඒවායෙහි අවසරලත් හර කිරීම් සහ බැර කිරීම්, අදාළ පනතෙහි 9 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලයලත් වෙළෙඳුන් හට නිකුත් කරන ලද විධානයන්ට අනුකූලව විය යුතු ය.

5. මෙම නියෝගවල කාර්යය සඳහා, නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් වනුයේ, ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් (ඇ.එ.ජ. ඩොලර්), යූරෝ, ස්ටර්ලිං පවුම්, ඕස්ට්‍රේලියානු ඩොලර්, සිංගප්පූරු ඩොලර්, ස්වීඩන ක්‍රෝනර්, ස්විස් ෆ්‍රෑන්ක්, කැනේඩියානු ඩොලර්, හොංකොං ඩොලර්, ජපන් යෙන්, ඩෙන්මාර්ක ක්‍රෝනර්, නෝර්වීජියානු ක්‍රෝනර්, චීන රෙන්මින්බි සහ නවසීලන්ත ඩොලර් ය.

**මහින්ද රාජපක්ෂ,**
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2020 අප්‍රේල් මස 08 වැනි දින,
කොළඹ දී ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.